# තරුණ අසහනය දුරු කරන නව සංවිධාන රටාවක්

තරුණ අසහනය ඇති වීමට බලපාන ප්‍රධාන හේතු රාශියක් ඇත. මින් මුල් තැනක් ගන්නා හේතුව නම් මහා සමාජයේ අවශ්‍යතාවයන් ගෙන් තරුණයන් වෙන්කොට අයින්කොට තිබීමයි. වැඩිහිටියන් විසින් එක පැත්තකින් මෙම වෙන් කිරීම සිදුකර ඇති අතර ජාතික මට්ටමේ අධ්‍යාපන ප්‍රතිපත්ති සංධකයින් විසින් ඇති කොට ඇති පටු අධ්‍යාපන ප්‍රතිපත්ති නිසා තරුණයින් අසහනයට පත්වී ඇත. යටත් විජිතවාදී ආකල්ප දූරු බොහෝ අධ්‍යාපන ප්‍රතිපත්ති සාධකයින් විසින් තරුණයා උගතකු විය යුත්තේ ලිපිකරුවකු ගුරුවරයෙකු වැනි වෘත්තියක් වෙනුවෙන් යයි හඳුන්වා ඇති අතර ඒ අනුව ගැලපෙන අධ්‍යාපන රටාවන්ද ගොඩනගා ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ ගුරුවරුන්, ලිපිකරුන් වැනි රැකියාවලට ඇත්තේ එක්තරා සීමිත ඉඩකඩක් වන නිසා ඉන් පරි බාහිර තරුණ උගතුන් වී රැකියාව, දුගීකම වැනි තත්වයන්ගෙන් පීඩා විඳින බව පෙනේ. ඒ නිසාම ඔවුන් පවතින සමාජ රාමුව කඩා බිඳ දැමීමට නොයෙක්විට උත්සාහ දරණ බව පසුගිය දසකයේ ලෝකයේ සිදුවූ විවිධ වෙනස්කම් හා හැල හැප්පීම් ආශ්‍රයෙන් තේරුම් ගත හැක.

ඇත්ත වශයෙන්ම රටක අධ්‍යාපනය හෝ රටක සංවර්ධන ප්‍රතිපත්තීන් සකස් විය යුත්තේ එම රටෙහි තරුණ ජනගහනය රටේ ආර්ථිකය වෙත, වඩාත් සරලව පවසන්නේ නම් රටේ දියුණුව වෙත උරාගත හැකි ආකාරයෙනි. එසේ නොවන්නේ නම් තරුණ අසහනයත් එසේම වී රැකියාව, දුගීකම වැනි ලක්ෂණත් ඉතා පැහැදිලිව සමාජයත් තුල දැකිය හැකි අතර එම ප්‍රශ්ණ මුල් කරගෙන කිසියම් සමාජයක ඒ සම්බන්ධව ගොඩ නැගෙන අතුරු ප්‍රශ්ණ රාශියකටද මුල්විය හැක.

පර්යේෂණ හා පුහුණු ස්රීම් නිලධාරි
- පී. වී. ආර්. කුමාරසිරි විසින් -

කිසියම් රටක ක්‍රියාත්මක වන සංවර්ධන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් වුවද පුලුල් මහජන සහභාගීත්වයක් බලාපොරොත්තු වන්නේ නම් ඒ



මෙබඳු තරුණයන් සංවිධානය කිරීම අවශ්‍යයයි.

ඒ සමාජ කොටස් උරාගත හැකි විවිධ වැඩ සටහන් ඒ සඳහා ඉදිරිපත් කල යුතුය. මෙවැනි තරුණ පිරිස් වැඩි වැඩියෙන් සංවර්ධනමය ක්‍රියා මාගීයක්

වෙත යොමුකල ව්‍යාපෘතියක් ලෙස ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි හඳුන්වා දුන් සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය දැක්විය හැකිය. කණ්ඩායමක් වශයෙන් සුළු ගොවීන් සංවිධානය වී කෘෂි ක්ෂේත්‍රයෙදී මෙන්ම තමන්ට ආර්ථික තත්වය නගා සිටුවා ගැනීම මේ ව්‍යාපෘතියෙහි මූලික පරමාර්ථයයි.

මෙම ව්‍යාපෘතිය මගින් තරුණ ශ්‍රමය තරුණ හැකියාවන් මනාව තේරුම් ගෙන තරුණයින්ගේ ආකල්ප රටාව හා අදහස් වලට ගැලපෙන පරිදි ව්‍යාපෘතීන් ආරම්භ කොට ඇත. කිසියම් සංවර්ධන ව්‍යාපෘතිය ආශ්‍රයෙන් තේරුම් ගත් වැදගත් අත් දැකීමකි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ දුම්මලසූරිය ගොවිජන සේවා කමිටු ප්‍රදේශයෙහි පිහිටවූ එක් සුළු ගොවි සංවිධානයක නායකත්වය හා වගකීම් අනුකමිටු ආශ්‍රයෙන් බෙද ගෙන ඇත්තේ තරුණ සුළු ගොවීන් කණ්ඩායමකි. ඔවුන් විසින් ඒ ගොවි සංවිධානය තුලට ඒ ඒ විෂය ක්ෂේත්‍රයන් වෙනු වෙන් අනු කමිටු පිහිටුවා ගෙන ඇති අතර විශේෂ යෙන් බැංකු කටයුතු, ඉතිරි කිරීම් කටයුතු කෘෂි සේවා ලබා ගැනීමේ කටයුතු වලදී මෙම අනු කමිටුවල තරුණ නායකයින්ගේ පෞරුෂත්වයයි හා නායකත්ව රටාව මැනවින් කැපී පෙනේ.

තරුණ කොටස් මහා සමාජයේ සංවර්ධනය ක්‍රියා මාර්ගයන් වෙත වැඩියෙන් යොමු කිරීමට හැකි වැදගත් මාර්ගයක් ලෙස ඔවුන්ගේ කාර්ය භාරයන් අගය කිරීම ඉතා වැදගත්ය. වැඩි හිටියන් මෙන්ම, ප්‍රතිපත්ති සාධකයින්, සංවර්ධන ක්‍රියා මාර්ගයන් රට තුල ව්‍යාප්ත කරන පිරිස විසින් තරුණයින්ගේ හැකියාවන්, ඔවුන්ගේ නිර්මාණයන් අගය කරන්නේ නම් ඒ පිළිබඳව ඔවුන් වඩවඩාත් උනන්දුවනු දැකිය හැකිය. සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය යටතේ මාසයකට රැස්වන සෑම ගොවි සංවිධානයක් විසින්ම පසුගිය මාසයේ ගොවි සමිතිය විසින් තීරන කල ක්‍රියා මාර්ගයන් කෙසේ සිදුවී ඇත්දැයි අධීක්ෂණය කිරීම සිදුවන අතර මෙතෙක් ඉටුනොවී ඇති ක්‍රියා මාර්ගයන් ඉටු කර ගැනීම විෂයෙහි ඒ ඒ කෘෂි විෂය ක්ෂේත්‍රයන් භාරව කටයුතු කරන නිලධාරීන් හමුවී ඒ සම්බන්ධව සාකච්ඡා කිරීම සිදුවේ. මෙයාකාරයෙන් නොකඩවා ගලා යන ක්‍රියා මාර්ගයන් කිසියම් ව්‍යාපෘතියක් ආශ්‍රයෙන් තරුණයින් වෙත ඉදිරිපත් කරන්නේ නම් ඔවුන්ගේ උදාසීනබවත්, අසහන කාරී මානසික තත්වයන් ක්‍රමයෙන් ඔවුන් වෙතින් පහව යයි.

ගතානුගතික ආකල්ප හා ක්‍රියා මාර්ගයන් විෂයෙහි තරුණයින් දක්වන නොකැමැත්ත තරුණයා සංවර්ධන ව්‍යාපෘතියට යොමු කිරීමේදී බාධා ඇති කරයි. ගතානුගතික ආකල්ප හෝ නව ආකල්ප වල තිබෙන අයහපත් බව කිසියම්



මෙබඳු පර්යේෂණ තොරතුරු | තරුණයන් වෙත ගෙනයාමට සංවිධානයක් අවශ්‍යය.

සමාජයක දියුණුවට බාධා පමුණුවයි. සංවර්ධනය යනුවෙන් හැඳින්වෙන්නේ සමාජය පිළිගත් සංස්ථා රටාවට බාධා නොපමුණුවන ආකාරයේ විභෞතික දියුණුවත් පුද්ගලයන් තුල ඇති කිරීමයි. මේ තත්වය ඉතා වැඩි වශයෙන් තේරුම් ගත් අවස්ථාවක් වශයෙන් සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය දක්විය හැක. තරුණයින් කෘෂි කර්මාන්තය විෂයෙහි නොකමැත්ත දක්වන්නේ ඇයි දයි විද්‍යාත්මකව තේරුම් ගත් කිතලව ගමේ ගොවි සංවිධානය විසින් තරුණ ගොවීන් ඒ සඳහා උනන්දු කරවීමට අත් ට්‍රැක්ටරයක් ගොවි සංවිධානයේ පාවිච්චියට මිලදී ගෙන ඇත. පාරම්පරික ක්‍රම උපයාගත් කෘෂිකර්මාන්තය විෂයෙහි භාවිතා කිරීමට නොකැමති මේ පිරිස අත් ට්‍රැක්ටරය භාවිතා කිරීම කලින් තම දෙමාපියන්ගේ කෘෂි කාර්මික කටයුතු විෂයෙහි මනා සහයෝගයක් දක්වන බව පෙනී ගොස් ඇත.

තරුණ ශ්‍රමය සංවර්ධන ව්‍යාපෘතීන් වෙත යොමු කරනවා සේම ඔවුන්ගේ නිර්මානාත්මක විවේකය ගතකල හැකි පහසු මාර්ගද ඔවුන් වෙත හඳුන්වාදීම සුළු ගොවි සංවිධාන ව්‍යාපෘති යෙන් සිදුවී ඇත. ඉබ්බාගමුව ගොවිජන සේවා කම්ටු ප්‍රදේශයෙහි "මුරුතව" ගම ආශ්‍රයෙන් ක්‍රියාත්මක වන සුළු ගොවි සංවිධානයේ තරුණ කොටස් මීමැසි පාලන ව්‍යාපෘතීන් වෙත අද යොමුවී ඇති අතර එමගින් ඔවුන් තමන්ගේ යැපීම කටයුතු තම දෙමාපියනට බරක් නොවී සපයා ගැනීම සන්තෝෂයට කරුණකි. එමෙන්ම මේ පිරිස තමන්ගේ නිර්මානාත්මක විවේකයේදී අත්පන්දු ක්‍රීඩාවේ යෙදීම සන්තෝෂයට කරුණක් වන අතර ජීව විද්‍යාත්මක වශයෙන් ඔහු තුල



ඇති කායික හැකියාවත් මානසික වශයෙන් ඔහු තුල ඇති අභිමානවත් යහපත් දෙයක් වෙනුවෙන් යෙදූ අවස්ථාවන් වශයෙන් මෙය දක්විය හැකැ

තරුණයින්ගේ කායික හැකියාව මෙන්ම මානසික වශයෙන් ඔවුන්ගේ ආකල්ප රටාවක් පැහැදිලිව තේරුම් ගැනීම අද ඉතා වැදගත්වී ඇත. ලෝකයේ දේශපාලනික, සමාජීය, ආර්ථික හා සංස්කෘතික වශයෙන් විවිධ වෙනස්කම් පිළිබඳව කුතුහලයකින් කරුනු සෙවීමට අද තරුණයින් පුරුදු පුහුණුවී ඇත. ඒ තත්වය හේතුකොට ගෙන තරුණයින්ගේ ආකල්ප රටාව, අදහස්, උදහස් ආචාරධර්ම හා වටිනාකම් අද සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. මේ තත්වය ඉතා සැලකිල්ලෙන් තේරුම් ගෙන එවූනි බුද්ධිමය තරුන කොටස් රටාව එලදයි ආකාරයෙන් ක්‍රියාත්මක වන සංවර්ධනමය ව්‍යාපෘතීන් වෙත යොමු කිරීම රටේ සෞභාග්‍යය උදකරවීමක් ලෙස පෙන්වා දිය හැක.